# අස්ගිරි සඟ පරපුරින් ඉටු කෙරුණු ශාසනික මෙහෙවර (අස්ගිරි උපත හා අස්ගිරි තල්පත ඇසුරෙන්)

ඊ.ඩබ්ලිව්. ඒ. එච්. සී. ගුණසිංහ[1]
ආර්. ඩබ්ලිව්. ප්‍රියදර්ශන බණ්ඩාර[2]

## හැඳින්වීම

මහාවිහාරවංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ උභය පාර්ශ්වයන්ගෙන් එකක් වන අස්ගිරි පාර්ශ්වය අඛණ්ඩ දිගු ඉතිහාසයකට හිමිකම් කියන සඟ පරපුරක් වශයෙන් හඳුනාගත හැකි අතර බුද්ධකාලීනව වැඩසිටි විනයධරයන් අතර අග්‍රස්ථානය හිමිවූ උපාලි මහ රහතන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරෙන් උන්වහන්සේලා පැවත එන බව කියවේ. ලක්දිව බුදුසමය පිහිට වූ මහා මහින්ද හිමියන්ගේ ආචාර්යවරයා වූ මොග්ගලීපුත්ත තිස්ස මහ තෙරුන් උපාලි මහ තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් පැවත ආ බව දැක්වෙන අතර එනිසා ආරම්භයේදී ලක්දිව භික්ෂු පරපුර ද උපාලි මහ තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට අයත් වුව ද, පසුව ඇතිවුණු නිකාය භේදයත් සමග මහාවිහාරීය භික්ෂු පරපුර පමණක් එයට ඇතුළත් වූ බව පෙනේ. ඒ තුළ ද ක්‍රමයෙන් අරණ්‍යවාසී සහ ග්‍රාමවාසී නමින් ඇතිවුණු බෙදීම හමුවේ උදුම්බරගිරිය හෙවත් දිඹුලාගල මුල්කරගත් අරණ්‍යවාසී සඟ පරපුර බිහිවුණි. මේ අන්දමින් මහාවිහාරවංශික භික්ෂූන් වහන්සේලා ස්ථාන හා ප්‍රතිපත්ති මුල්කොටගෙන විකාශය වීමේ උච්චතම අවස්ථාව වශයෙන් දැක්විය හැක්කේ දිඹුලාගල මුල්කරගත් අරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා සහ නාගරික ප්‍රදේශ මුල්කරගත් ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේලා අතින් පිළිවෙලින් වර්තමානයේ අස්ගිරි සහ මල්වතු විහාර පාර්ශව නමින් හඳුන්වන භික්ෂු කණ්ඩායම් දෙකක් බිහිවීමයි.

කාලිංග මාඝගේ ආක්‍රමණය හමුවේ යාපහුවට ආරක්ෂාව පතා වැඩම කළ උදුම්බරගිරි භික්ෂු පරපුර සඳහා වලස්ගල අරණ්‍යයක් ඉදි කරවා පූජා කිරීම සිදු කෙරුණු අතර කුරුණෑගල යුගයේදී සෙංකඩගල ඉදිකෙරුණු නව අරණ්‍ය සේනාසනයකට වලස්ගලින් භික්ෂූන් වහන්සේලා පිරිසක් වැඩම කරවා ගෙන තිබේ. එහිදී වලස්ගල නාමයෙහි පද පෙරළිය ලෙස "අච්ඡගිරි" යන්නත්, නැවත එහි සිංහල පෙරළිය ලෙස "අස්ගිරි" යන වත්මන් ව්‍යවහාරික නාමයත් ඇතිවූ බව පෙනේ. මේ අනුව සෙංකඩගල ඉදිකෙරුණු අරණ්‍යය අස්ගිරි සෙනසුන යන නමින් ව්‍යවහාර කෙරුණි. එතැන් පටන් එම භික්ෂු පරපුර වැඩ සිටි ස්ථානයේ නාමය

1 පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය, කැලණිය විශ්වවිද්‍යාලය. hachagu@gmail.com
2 පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය, කැලණිය විශ්වවිද්‍යාලය.

මුල්කොටගෙන අස්ගිරි පාර්ශ්වීය භික්ෂූන් වහන්සේලා යන නමින් ද හඳුන්වන්නට වුණි.

වැලිවිට සරණංකර සංඝරාජ සමය වන විට ද අස්ගිරි ගණනායක නම් තනතුර යටතේ අස්ගිරි පාර්ශවය සංවිධාන වී පැවති බවට කරුණු හමුවේ. පෙර දැක්වූ අන්දමට ඒ වන විටත් මල්වතු විහාර පාර්ශවය නමින් තවත් භික්ෂු කණ්ඩායමක් පැවති හෙයින් දෙපාර්ශවය අතර පැවති තරගකාරීත්වය හේතුකොටගෙන ආරම්භයේ පටන් අස්ගිරි පාර්ශ්වික භික්ෂූන්ගෙන් ඉටුවූ ශාසනික මෙහෙවර කැපී පෙනේ.

## අරමුණ හා ක්‍රමවේදය

වර්තමානයේ අස්ගිරි පාර්ශවය යනුවෙන් හඳුන්වන සඟ පරපුරේ ආදිකතෘන් වහන්සේලාගෙන් ඉටු කෙරුණු ශාසනික මෙහෙවර පිළිබඳ අධ්‍යයනයක් සිදුකිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. එහිදී ඓතිහාසික ක්‍රමවේදය භාවිත කරන ලද අතර ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය, ද්විතීයික සාහිත්‍යය මූලාශ්‍රය සහ පුරාවිද්‍යා මූලාශ්‍රය කෙරෙහි අවධානය යොමුකොට තිබේ. මෙහිදී ***අස්ගිරි උපත*** සහ ***අස්ගිරි තල්පත*** යන අස්ගිරි පාර්ශවයේ වංසකතාවන් මුල්තැන්හි තබාගනිමින් සෙසු සාහිත්‍යමය මූලාශ්‍රය ද තුලනාත්මක අධ්‍යයන සඳහා භාවිතකරන ලදී.

## පර්යේෂණයේ ප්‍රතිඵල

ලාංකේය ශාසන ඉතිහාසය අතිශය වැදගත් සිදුවීම වශයෙන් සැළකෙන භාණක පරම්පරානුගතව පවත්වා ගෙන එනු ලැබූ පිටකත්‍රය සහිත අට්ඨකතා ග්‍රන්ථාරූඪ කිරීමෙහිලා මූලිකත්වය ගනු ලැබුවෝ නම් අස්ගිරි විහාර පරපුරේ ආදිකතෘන් වහන්සේ වශයෙන් ***අස්ගිරි තල්පත*** හඳුන්වා දෙන "ථූපාරාම නිවාසී කුන්තගත්ත තිස්ස" මහ රහතන් වහන්සේ ය. මෙහිදී පඤ්ච මහාවාස නිවාසී මහරහතන් වහන්සේලා ලෝවාමහාපායට රැස්ව සංඝ සම්මේලනයක් පවත්වා ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ යුතු බවට ඇතිකරගත් සම්මුතියක ප්‍රතිඵලයක් වශයෙන් මාතුල දනව්වේ අළු ලෙනේදී ත්‍රිපිටක ග්‍රන්ථාරූඪ කාර්යය සිදුව තිබේ. ***අස්ගිරි තල්පතේ*** එන මෙකී තොරතුරුවලට අනුව තදීය යුගයේ විසූ ශාසනානුශාසක තෙරුන් වහන්සේ ලෙසට ද කටයුතු කරන්නට ඇත්තේ කුන්තගත්ත තිස්ස මහ රහතන් වහන්සේ විය යුතුය. පසුව උන්වහන්සේ දිඹුලාගල හෙවත් උදුම්බරගිරියට වැඩම කළ අතර උන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව දිඹුලාගල අරණ්‍යවාසී සඟ පරපුර වශයෙන් විකාශය වී තිබේ.

අනුරාධපුර රාජධානියේ පරිහානියත් සමග උදාවූ ශාසන පරිහානිය මහා විජයබාහු සමයෙහි නිමාවට පත් කරමින් රජුගේ අනුග්‍රහය ඇතිව රාමඤ්ඤ දේශයෙන් සංඝයා වැඩම කරවා නැවත උපසම්පදාව ඇති කිරීම සිදුකෙරුණු අතර

***අස්ගිරි තල්පතට*** අනුව එලෙස මෙරටට වැඩම කරවන ලද්දේ අනුරාධපුර රාජධානි පරිහානි සමයේ මෙරටින් රාමඤ්ඤ දේශයට වැඩම කරවන ලද ලාංකික භික්ෂූන් වහන්සේලා ය. එකී උපසම්පදාවේදී උදුම්බරගිරි භික්ෂූන්ට වැඩි ප්‍රමුඛත්වයක් හිමිවූ බවක් ***අස්ගිරි තල්පතෙන්*** පෙනෙන හෙයින් රාමඤ්ඤ දේශයේ සිට මෙරටට වැඩම කළ භික්ෂූන් වහන්සේලා අතර බහුතරය උදුම්බරගිරි භික්ෂූන් වහන්සේලා වූ බව සිතිය හැක.

මහා පරාක්‍රමබාහු රජු විසින් ලංකාව එක්සේසත් කොට සංඝ ශාසනයේ සාමග්‍රීය උදෙසා සිදුකරන ලද සංඝ සංශෝධනයේදී ද දිඹුලාගල පාර්ශවයේ මහාකාශ්‍යප මහ තෙරුන් වහන්සේ ප්‍රධානත්වය උසුලමින් තුන් නිකා එක් නිකාකොට ප්‍රථම ශාසන කතිකාවත සම්පාදනය කරනු ලැබූහ. ඒ තුළින් නැවත වරක් මහාමහින්ද හිමියන් විසින් ඇතිකළ ඒකීය මහාවිහාර භික්ෂු සම්ප්‍රදාය ස්ථාපිත විය. ඉනික්බිතිව රජු විසින් පිරිනමන ලද සංඝ නායකත්වය ප්‍රතික්ෂේප කළ දිඹුලාගල මහාකාශ්‍යප මහ තෙරුන් පෙරළා දිඹුලාගලට වැඩම කළ අතර එම ධූරය උන්වහන්සේගේ ශිෂ්‍ය ශාරිපුත්‍ර මහ තෙරුන්ට පැවරුණි. ඒ අනුව ලංකාවේ සමස්ත භික්ෂු පරපුර එක් නායකත්වයකට ගෙන ඒමට හැකිවූයේ ද අස්ගිරි පාර්ශවයේ ආදි කතෘන් වහන්සේලා හේතුවෙන් බව පෙනේ.

අනතුරුව දඹදෙණි රාජ සමයේ පටන් සිදු කරන ලද ශාසන කතිකාවත් සේම ශාසන ශෝධන සෑම එකකම පාහේ ප්‍රධානත්වය සහ ප්‍රධාන දායකත්වය අස්ගිරි පාර්ශවයේ ආදිකතෘන් වහන්සේලා උසුලා ඇති බව පෙනේ. දඹදෙණියේ III විජයබා රජ සමයේ සිදුකළ ශාසන කතිකාවත සඳහා දිඹුලාගල පරපුරේ සංඝරක්ෂිත හා මේධංකර මහ ස්ථවිරයන් වහන්සේලා මුල් වූ අතර II පැරකුම්බා සමයේ සිදුකළ ශාසන කතිකාවතේ ප්‍රධානත්වය දිඹුලාගල පරපුරේ මේධංකර මහ ස්ථවිරයන් විසින් උසුලා තිබේ. පසුව ගම්පොළ රාජධානි සමයේ සේනාලංකාධිකාර අමාත්‍ය විසින් රාජානුග්‍රහ යටතේ සිදු කළ ශාසන ශෝධනය සඳහා පලාබත්ගලවාසී දෙවනගල වනරතන හිමියන් සහ රාජගුරු භුවනෙකබාහු තෙරුන් ද, අලගක්කෝනාර අමාත්‍ය විසින් රාජානුග්‍රහ යටතේ සිදුකළ ශාසන ශෝධනය සඳහා පලාබත්ගලවාසී ධර්මකීර්ති මහ තෙරුන් ද, පසුව රජ පැමිණි වීරබාහු නම් ඇපාණන් විසින් සිදුකළ ශාසන ශෝධනය සඳහා පලාබත්ගලවාසී දෙවන ධර්මකීර්ති මහ තෙරුන් ද පිළිවෙලින් ප්‍රධානත්වය උසුලා තිබේ. මෙම පලාබත්ගල භික්ෂු පරපුර දිඹුලාගලවාසී දීපංකර හිමියන්ගේ ශිෂ්‍ය පරපුරකින් ඇතිවූ ***අස්ගිරි තල්පත*** හා ***අස්ගිරි උපත*** සඳහන් කරයි.

දළදා වහන්සේ උදෙසා විශේෂ අයිතිවාසිකමක් අස්ගිරි පාර්ශවයේ ආදිකතෘන් වහන්සේලා සතුව පැවති බව පෙනෙන අතර එනිසා එහි සුරක්ෂිතභාවය පිළිබඳ අනුරාධපුර රජ සමයේ පටන් උන්වහන්සේලා සැළකිලිමත් වූ බව පෙනේ. මාඝගේ ආක්‍රමණයක් හේතුවෙන් සංඝයා වහන්සේලා පිහිටි රට අතහැර ආරක්ෂිත ස්ථාන කරා වැඩම කිරීමේදී දන්ත ධාතූන් වහන්සේ සහ පාත්‍රා

ධාතූන් වහන්සේ ආරක්ෂිතව සඟවා තැබීමට කටයුතු කළ බව කියැවෙන අතර ඒ සඳහා මූලික වූයේ දිඹුලාගල සංඝ පරපුරේ වැඩසිටි ප්‍රධාන භික්ෂූන් වහන්සේ බව පෙනේ.

මහනුවර රාජධානිය ආරම්භයේදී දෙල්ගමුවේ තැන්පත්කොට තිබූ දළදාව මහනුවරට වැඩමකරවීම සඳහා I විමලධර්මසූරිය රජු විසින් අස්ගිරි පාර්ශවයේ භික්ෂූන් වහන්සේ නමක් වූ ඇල්ලේපොළ මංගල හිමියන් ඇතුළු පිරිසක් පිටත් කළ බව ***අස්ගිරි උපත*** දක්වයි. මහනුවර වැඩම කරවූ දළදාව උදෙසා චාරිත්‍රවාරිත්‍ර ප්‍රකාරව පුද සිරිත් කිරීම සඳහා රජුගේ අණින් මංගල හිමියන්ට පැවරුණු බව එහි වැඩිදුරටත් දැක්වේ. සෙනරත් රජ සමයේ එල්ලවුණු පෘතුගීසී ප්‍රහාරය හමුවේ දළදාවේ ආරක්ෂාව අස්ගිරි පරපුරේ දෙනගමුවේ ධර්මකීර්ති හිමියන්ට ද, II රාජසිංහ රජ සමයේදී ඕලන්දයන්ගෙන් කන්ද උඩරටට එල්ලවුණු ප්‍රහාර හමුවේ දළදාවේ ආරක්ෂාව අස්ගිරි පාර්ශවයේ දුනුමාලේ ධම්මපාල හිමියන්ට ද පවරා තිබෙන බව ***අස්ගිරි උපතේ*** සඳහන් වෙයි.

මේ හැරෙන්නට ලංකාවේ ප්‍රධාන පූජනීය ස්ථාන සහ පූජනීය වස්තූන් වශයෙන් සැළකෙන ශ්‍රී මහා බෝධිය ඇතුළු අනුරාධපුර අටමස්ථානය, ශ්‍රී පාදස්ථානය සහ කැලණි විහාරයේ ද භාරකාරත්වය මුල්කාලීනව අස්ගිරි පාර්ශවයේ ආදිකතෘන් වහන්සේලාගේ භාරකාරත්වයේ පැවති නමුත් පසුකාලීනව මෙම පූජනීය ස්ථාන සියල්ලේම භාරකාරත්වය මල්වතු විහාර ගණය හිමිකරගත් අතර දළදා වහන්සේගේ භාරකාරත්වය දෙපාර්ශවයටම හිමිවුණි. එවැන්නක් සිදුවුව ද එතෙක් ඒවායේ සුරක්ෂිතභාවය උදෙසා අස්ගිරි පාර්ශවීය භික්ෂූන් වහන්සේලා විසින් සිදුකළ කැපවීම අතිමහත් ය.

**සමාලෝචනය**

මේ අනුව බැලීමේදී වර්තමානයේ අස්ගිරි පාර්ශවය යනුවෙන් හඳුන්වන සංඝ පරපුරේ ආදිකතෘන් වහන්සේලා ආරම්භයේ පටන් ලක්දිව සංඝ පරපුරේ සහ බුදු සසුනේ චිරස්ථිතිය පිණිස සැමවිටම ප්‍රමුඛව කටයුතු කර ඇති බව පැහැදිලි වේ. විශේෂයෙන්ම ලාංකේය සංඝ පරපුර උදෙසා සැමවිටම නායකත්වය සපයමින් උන්වහන්සේලා ගෙන ඇති ක්‍රියාමාර්ග ඇගයිය යුතුය. ඒ යටතේ ත්‍රිපිටක ග්‍රන්ථාරූඪය, ශාසන ශෝධන හා කතිකාවත් සම්පාදනයට මුල්වීම මෙන්ම රාජත්වයේ සංකේතය වූ දළදාවේ ආරක්ෂාව උදෙසා කරන ලද කැපවීම අනුස්මරණීය කළ යුතු වන්නේම ය.

**ප්‍රමුඛ පද** : අස්ගිරිය, අස්ගිරි තල්පත, අස්ගිරි උපත, ආගමික, භික්ෂූන් වහන්සේ

**ආශ්‍රිත ග්‍රන්ථ**

රෝහණධීර, මැන්දිස්. (සංස්.). (1997). *අස්ගිරි තල්පත*. කතෘ ප්‍රකාශන. බත්තරමුල්ල.

රෝහණධීර, මැන්දිස්. (1998). *අස්ගිරියෙන් උඩරට ඉතිහාසය*. කතෘ ප්‍රකාශන. බත්තරමුල්ල.

සීලක්ඛන්ධ හිමි, තුඹුල්ලේ. (1997). *අස්ගිරි මහාවිහාරයේ ප්‍රභවය. විකාශය හා තදනුබද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය*. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

සුමංගල හිමි, අම්බුළුගල, (2013). *උදුම්බරගිරි වංශය සහ අස්ගිරි පුවත*, කොළඹ 10: දයාවංශ ජයකොඩි සහ සමාගම.

ආනන්ද හිමි, කෝන්ගස්තැන්නේ (සංස්.),(2008). *නිකාය සංග්‍රහය*. කොළඹ: සමයවර්ධන පොත්හල.

*ලංකා විශ්වවිද්‍යාලය ලංකා ඉතිහාසය පළමු කාණ්ඩය හා දෙවන කාණ්ඩය*